සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

**පෙරදිග සංගීතය I**
**கீழைத்தேய சங்கீதம் I**
**Oriental Music I**

**54 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

විභාග අංකය : ................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 4 | |
| 02 | 5 - 11 | |
| 03 | 12 - 18 | |
| 04 | 19 - 24 | |
| 05 | 25 - 30 | |
| 06 | 31 - 41 | |
| 07 | 42 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක **1** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** රාගයක සංවාදි ස්වරය පිහිටන්නේ, වාදි ස්වරයේ සිට,
(1) දෙවන හෝ තුන්වන ස්වරය මත ය. (2) තුන්වන හෝ හතරවන ස්වරය මත ය.
(3) හතරවන හෝ පස්වන ස්වරය මත ය. (4) පස්වන හෝ හයවන ස්වරය මත ය.
(5) හයවන හෝ හත්වන ස්වරය මත ය. (......)

**2.** ඛ්‍යාල් ගායනයක දී ක්‍රමවත් ලෙස ස්වර නො යෙදෙන තාන වර්ගය කුමක් ද?
(1) ශුද්ධ තාන (2) අලංකාරික තාන (3) කූට තාන
(4) ආරෝහී තාන (5) සපට් තාන (......)

**3.** නිර්දේශිත රාග අතුරෙන් සම්පූර්ණ ජාතියට අයත්, අවරෝහණයේ දී පමණක් කෝමල ගාන්ධාරය යෙදෙන රාගය සහ උදය සන්ධි ප්‍රකාශ රාගය පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
(1) තිලක්කාමෝද් සහ දේස් (2) ජයජයවන්ති සහ භෛරව
(3) තිලක්කාමෝද් සහ ආසාවරී (4) දේස් සහ භෛරව
(5) ජයජයවන්ති සහ ජෞනපුරි (......)

**4.** වයලීන්, එස්රාජ් සහ සිතාර්, සරෝද් යන සංගීත භාණ්ඩ වාදනයේදී එක් ස්වරයක සිට තවත් ස්වරයක් දක්වා හඬ නොකඩවා පවත්වාගෙන යාම පිළිවෙළින් හඳුන්වනු ලබන්නේ,
(1) මීන්ඩ් - ජෝඩ් වශයෙනි. (2) මීන්ඩ් - සූත් වශයෙනි.
(3) ආන්දෝලන - ජෝඩ් වශයෙනි. (4) සූත් - ආන්දෝලන වශයෙනි.
(5) සූත් - මීන්ඩ් වශයෙනි. (......)

[දෙවැනි පිටුව බලන්න.

**5.** රාත්‍රී 7 සිට රාත්‍රී 10 දක්වා ගානසමය යෙදෙන රාගවල ඇති විශේෂ ලක්ෂණය තෝරන්න.

(1) කල්‍යාණ, බිලාවල් හෝ ඛමාජ් ථාටයට අයත් වීම

(2) පූර්වි, මාර්වා හෝ භෛරව ථාටයට අයත් වීම

(3) ආසාවරී, භෛරවී හෝ තෝඩි ථාටයට අයත් වීම

(4) කාෆි, ආසාවරී හෝ භෛරව ථාටයට අයත් වීම

(5) කාෆි, ආසාවරී හෝ භෛරවී ථාටයට අයත් වීම (......)

**6.** | ධාධා ධාතිරි කිටධා තිරිකිට | ධාධා තිරිකිට ධාධා තූනා

| තාතා තාතිරි කිටතා තිරිකිට | ධාධා තිරිකිට ධාධා තූනා

ඉහත දක්වා ඇත්තේ,

(1) කායදාවකි. (2) පල්ටාවකි. (3) මුඛඩාවකි.

(4) රේලාවකි. (5) තිහායි එකකි. (......)

**7.** රි ස ග රි ග ස, ග රි ම ග ම රි යන ස්වර අභ්‍යාසයේ ආරෝහණ ස්වරූපයේ අවසාන පියවර රි̇ ස̇ ග̇ රි̇ ග̇ ස̇ වන විට එම අභ්‍යාසයේ අවරෝහණ ස්වරූපයේ අවසාන පියවර කුමක් ද?

(1) රි ස රි නි̣ ධ̣ ස (2) ස රි නි̣ ස ධ̣ නි̣

(3) රි ග ස රි නි̣ ස (4) නි̣ ධ̣ ස රි නි̣ ස

(5) නි̣ ස ධ̣ නි̣ ධ̣ ස (......)

**8.** ස්වර සංඛ්‍යාව 12 ක් වුව ද ස්වර නාම 16 ක් වශයෙන් යොදා ගැනෙන්නේ,

(1) බටහිර සංගීතයේ ය. (2) උත්තර භාරතීය සංගීතයේ ය.

(3) දක්ෂිණ භාරතීය සංගීතයේ ය. (4) අප්‍රිකානු සංගීතයේ ය.

(5) ගැමිලැන් සංගීතයේ ය. (......)

- පහත සඳහන් ස්වර ඛණ්ඩය සහ ඊට සමගාමීව යොදා ඇති අංක ඇසුරෙන් **9** සිට **11** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ම | ප | නි | ස̇ | නි̱ | ධ | ප | ධ | ම | ග | රි | ග | රි | නි̣ | ස |

**9.** තිලක්කාමෝද් රාගය පිළිබිඹු වීමට ඉවත් කළ යුතු ස්වරවලට අදාළ අංක පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) 2, 5, 8, 11 සහ 13 (2) 3, 4, 12, 14 සහ 15

(3) 3, 5, 6, 13 සහ 14 (4) 3, 5, 9, 12 සහ 14

(5) 4, 6, 9, 14 සහ 15 (......)

**10.** ජයජයවන්ති රාගය පිළිබිඹු වීමට කළ යුතු වෙනස්කම හෝ වෙනස්කම් අඩංගු වරණය තෝරන්න.

(1) 1, 2 සහ 3 යන ස්වර ඉවත් කර 10 වන සහ 12 වන ස්වර කෝමල ගාන්ධාරය බවට පත් කිරීම

(2) 5 වන ස්වරය ශුද්ධ නිෂාදයත් 12 වන ස්වරය කෝමල ගාන්ධාරයත් බවට පත් කිරීම

(3) 10 වන ස්වරය කෝමල ගාන්ධාරය බවට පත් කිරීම

(4) 12 වන ස්වරය කෝමල ගාන්ධාරය බවට පත් කිරීම

(5) ඉහත සඳහන් ස්වර ඛණ්ඩයෙහි කිසිදු වෙනසක් නො කිරීම (......)

**11.** ඉහත ස්වර ඛණ්ඩය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මෙම ස්වර ඛණ්ඩයෙහි කිසිදු වෙනසක් නොකිරීමෙන් දේස් රාගය පිළිබිඹු වේ.

(2) ෂඩ්ජය, මධ්‍යමය සහ නිෂාදය යන ස්වර ඉවත් කළ විට හංසධ්වනි රාගය පිළිබිඹු වේ.

(3) ගාන්ධාර ස්වර කෝමල කිරීමෙන් ජයජයවන්ති රාගය පිළිබිඹු වේ.

(4) ගාන්ධාරය, නිෂාදය සහ ධෛවතය යන ස්වර කෝමල කිරීමෙන් ආසාවරී රාගය පිළිබිඹු වේ.

(5) නිෂාදය, ගාන්ධාරය සහ ධෛවතය යන ස්වර කෝමල කිරීමෙන් ජෞනපුරි රාගය පිළිබිඹු වේ. (......)

[තුන්වැනි පිටුව බලන්න.

**12.** නිර්දේශිත රාග අතුරෙන්, දිවා දෙවන ප්‍රහරයට අයත් ෂාඩව සම්පූර්ණ ජාති රාගය හා රාත්‍රී තෙවන ප්‍රහරයට අයත් කාෆි මේලගත රාගය පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

(1) ජෞනපුරි සහ බාගේශ්‍රී (2) ආසාවරී සහ දේස්
(3) ආසාවරී සහ බාගේශ්‍රී (4) දේස් සහ ආසාවරී
(5) බාගේශ්‍රී සහ ජෞනපුරි (……)

**13.** ආර්චික, ගාථික, සාමික සහ ස්වරාන්තරික යන නාදස්ථාන අදාළ වන්නේ,

(1) ධ්‍රැපද් ගායනයටයි. (2) වේද ගායනයටයි. (3) ඛ්‍යාල් ගායනයටයි.
(4) භජන් ගායනයටයි. (5) ධමාර් ගායනයටයි. (……)

**14.** රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගානසමය යෙදෙන පූර්වාංගවාදී රාගය තෝරන්න.

(1) බාගේශ්‍රී (2) භෛරව (3) ජයජයවන්ති
(4) දේස් (5) හංසධ්වනි (……)

**15.** චෞතාලය හා ඒක්තාලය වෙන් වෙන් වශයෙන් භාවිත කරන උතුරු ඉන්දීය ගායන ශෛලිය සහ ඊට අදාළ තාල වාද්‍ය භාණ්ඩය පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.

(1) සර්ගම් – තබ්ලාව සහ වර්ණම් – මෘදංගය
(2) ඛ්‍යාල් – ඩෝලය සහ චතුරංග – තබ්ලාව
(3) ඛ්‍යාල් – ඩෝලය සහ ධ්‍රැපද් – තබ්ලාව
(4) ධ්‍රැපද් – පක්වාජය සහ ඛ්‍යාල් – තබ්ලාව
(5) ධමාර් – තබ්ලාව සහ ධ්‍රැපද් – පක්වාජය (……)

**16.** උත්තර භාරතීය සංගීතයේ ගානසමය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) යම් රාගයක් අයත් වන ජාතිය ආශ්‍රයෙන් එම රාගයේ ගානසමය හඳුනාගත හැකි වේ.
(2) යම් රාගයක වාදී ස්වරය උත්තරාංගයේ පිහිටියේ නම්, එම රාගයේ ගානසමය රාත්‍රී 12 සිට දිවා 12 දක්වා යෙදෙන කිසියම් ප්‍රහරයකට අයත් වේ.
(3) රාත්‍රී කාලයේ දී කෝමල ස්වර යෙදෙන රාග පමණක් ගායනය හෝ වාදනය කිරීමට සුදුසු වේ.
(4) දහවල් කාලය ශුද්ධ ස්වර සහිත රාග ගායනය සඳහා ඉතා සුදුසු වේ.
(5) කෝමල ග, ධ, නි යෙදෙන රාග කුමන අවස්ථාවක වුව ද ගායනය හෝ වාදනය කළ හැකි වේ. (……)

**17.** පහත දැක්වෙන්නේ ගැමි ගී පාද පහකි.

A – කාරිය කෙරෙන තුරු කාගෙත් රැවටිල්ල
B – හිතේ දුකට නිදි නැතිවා කියාපන්
C – පෙරළුන පිටට කදිමයි කීය මේ පිට
D – අරන් යන්න සිතුනයි අඟුලෙන් ගමට
E – ළඟ නම් ගෙදර මුර ඇරුනම මම එනවා

ඉහත ගැමි ගී පාද අතුරෙන් දාර්ශනික අදහස් ගම්‍යවන ගී පාද යුගලය ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ C (2) A සහ E (3) B සහ C (4) B සහ D (5) D සහ E (……)

**18.** පහත දැක්වෙන ස්වර පාද අතුරෙන් "ඕඩි හෙලේ හෙල වටකර" බඹර ගීයට අයත් වන ස්වර පාද ඛණ්ඩය තෝරන්න.

(1) ධ ස ස ස – ස සරි ග – – ග ග රි ගරි ස – – – – ස රිස
(2) ධ ස ස ස – – – – – – රි ග ම ප ප ප – – – ධපධප ම ග රි – – –
(3) ග – ග ග ග – රි ස ස ස සරි ග – රිස ස රිග – රි ස –
(4) ධ ස ස ස – ස සරි ග – – ග ග රි – – ගරි රි ස – – – – – –
(5) ග ග ග රි ස ස ස ස ග ග රි ස, නි නි නි නි ස, රි ස ස ස – – – – (……)

**19.** ● සඳ වතුරෙන් මුව දෝවා
● රන්දු දස අත සංඛ නාදෙන්

රිද්ම ලක්ෂණ අනුව ඉහත ගී පාද දෙක ගායනය කළ හැකි තිත් රූප දෙක පිළිවෙළින්

(1) සුළු මැදුම් දෙතිතට සහ සුළු මහ දෙතිතට අයත් වේ.
(2) සුළු මැදුම් දෙතිතට සහ මැදුම් මහ දෙතිතට අයත් වේ.
(3) සුළු මහ දෙතිතට සහ සුළු මැදුම් දෙතිතට අයත් වේ.
(4) සුළු මහ දෙතිතට සහ මැදුම් මහ දෙතිතට අයත් වේ.
(5) මැදුම් මහ දෙතිතට සහ සුළු මහ දෙතිතට අයත් වේ. (……)

**20.** ● වරමාති සුබ චරිතේ
● භෝජරාජ සම තේජහිරාමා

ඉහත දැක්වෙනුයේ ප්‍රශස්ති ගීතයක ඇතුළත් කොටස් දෙකකි. එම කොටස් දෙක පිළිවෙළින් හඳුන්වන්නේ,

(1) කවිය සහ මුද්‍රප්පදය නමිනි.
(2) තානම සහ කවිය නමිනි.
(3) කවිය සහ ගීතය නමිනි.
(4) මුද්‍රප්පදය සහ කවිය නමිනි.
(5) තානම සහ මුද්‍රප්පදය නමිනි. (……)

**21.** හේවාරාල, අණබෙරකරු යන චරිත ඇතුළත් රංග ශෛලිය සහ එම චරිත සබයට හඳුන්වා දෙනු ලබන්නා පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

(1) නූර්ති – සූත්‍රධාරී
(2) කෝලම් – සබේවිදානේ
(3) කෝලම් – පොතේගුරු
(4) සොකරි – බෙරකරු
(5) සොකරි – සබේවිදානේ (……)

**22.** දක්ෂිණ භාරතීය මේල ඇසුරෙන් ස්ථායි, අන්තරා ගීත ආකෘතියෙන් බැහැරව නිර්මාණය වූ ගීත ඇතුළත් රංග ශෛලිය හා ඊට දායකත්වය සැපයූ කර්ණාටක සංගීතඥයා සඳහන් වරණය තෝරන්න.

(1) ප්‍රශස්ති – නාරසිංහ
(2) නූර්ති – විශ්වනාත් ලව්ජි
(3) නාඩගම් – අලගනායිදු
(4) කෝලම් – ජයාශංකර්
(5) වන්නම් – ගණිතාලංකාර (……)

**23.** 'අශෝකමාලා' චිත්‍රපටයේ ඇතුළත් ගීතයක් සහ එහි සංගීත නිර්මාතෘවරයා නිවැරදි ව නම් කර ඇති වරණය තෝරන්න.

(1) සිරිනි සරු සර වීලා – ආර්. මුත්තුසාමි
(2) මන රංජන දර්ශනීය ලංකා – ආනන්ද සමරකෝන්
(3) ආදර නදිය ගලා – බී.එස්. පෙරේරා
(4) ශාන්ත මේ රාත්‍රියේ – මොහොමඩ් ගවුස්
(5) සුදු සඳ එළියේ – සුනිල් ශාන්ත (……)

**24.** | ස – ස ස | ස – ස – | ස – – සස | ස සස සස |

යන ස්වර පාදය බටහිර සංගීත ක්‍රමයට අනුව ප්‍රස්තාර කිරීමේ දී එක් එක් ස්වරවල වටිනාකම දැක්වීමට යොදා ගත යුතු නිවැරදි සංකේත රටාව තෝරන්න.

(1) 𝅗𝅥 ♩ ♩ | 𝅗𝅥 𝅗𝅥 | 𝅗𝅥. ♩ ♩ | ♩ ♪ ♪ ♩ ♩
(2) 𝅗𝅥 ♩ ♩ | 𝅗𝅥 𝅗𝅥 | ♩. ♪ ♪ | 𝅗𝅥 ♪ ♪ ♩ ♩
(3) 𝅗𝅥 ♩ ♩ | 𝅗𝅥 𝅗𝅥 | 𝅗𝅥. ♪ ♪ | ♩ ♪ ♪ ♩ ♩
(4) 𝅗𝅥 ♪ ♪ | ♩ ♩ | 𝅗𝅥. ♪ ♪ | ♩ ♪ ♪ ♩ ♩
(5) ♩ ♪ ♪ | ♩ ♩ | 𝅗𝅥. ♩ ♩ | ♩ ♪ ♪ ♩ ♩ (……)

● අංක **25** සහ **26** ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් ස්වර ප්‍රස්තාරය උපයෝගි කරගන්න.




**25.** ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයට අදාළ නිවැරදි ටයිම් සිග්නේචරය (time signature) කුමක් ද?

(1) 7/8 (2) 6/8 (3) 5/8 (4) 3/4 (5) 9/8 (......)

**26.** ඉහත "A" අක්ෂරයෙන් සහ "B" අක්ෂරයෙන් දක්වා ඇති ස්වරවල වටිනාකම අනුපිළිවෙළින්,

(1) Quaver සහ Dotted Minim වේ.
(2) Quaver සහ Dotted Crotchet වේ.
(3) Demisemi Quaver සහ Dotted Minim වේ.
(4) Semi Quaver සහ Dotted Minim වේ.
(5) Semi Quaver සහ Dotted Crotchet වේ. (......)

**27.** ඉහළම සහ පහළම හඬතලවල ස්වර වාදනය කළ හැකි බටහිර සංගීත සම්ප්‍රදායට අයත් සංගීත භාණ්ඩ යුගලය පිළිවෙළින්,

(1) වයලින් සහ වියෝලා වේ.
(2) වයලින් සහ ඩබල්බේස් වේ.
(3) වියෝලා සහ චෙලෝ වේ.
(4) චෙලෝ සහ වයලින් වේ.
(5) ඩබල්බේස් සහ වයලින් වේ. (......)

**28.** රුක්මනී දේවී විසින් ගායනය කරන ලද 'සඳක් නැඟී සඳක් ගිලේ සාගරේ' නම් ගීතය සඳහා සංගීතයෙන් දායක වූයේ,

(1) ලා සිලොනියස් කණ්ඩායමයි.
(2) ධර්මරත්න බ්‍රදර්ස් කණ්ඩායමයි.
(3) ලොස් කැබෙලෙරොස් කණ්ඩායමයි.
(4) ත්‍රී සිස්ටර්ස් කණ්ඩායමයි.
(5) මූන්ස්ටෝන් කණ්ඩායමයි. (......)

**29.** පරිගණක මෘදුකාංගයක් ඇසුරින් සංගීතාංගයක් නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි පියවර අනුපිළිවෙළින්,

(1) පටිගත කිරීම, සංගීතය බෙදා හැරීම (export), සංගීත සංරචනය සහ සංයෝජනය ය.
(2) සංගීත සංරචනය, පටිගත කිරීම, සංයෝජනය සහ සංගීතය බෙදා හැරීම (export) ය.
(3) සංයෝජනය, සංගීත සංරචනය, පටිගත කිරීම සහ සංගීතය බෙදා හැරීම (export) ය.
(4) සංයෝජනය, පටිගත කිරීම, සංගීත සංරචනය සහ සංගීතය බෙදා හැරීම (export) ය.
(5) පටිගත කිරීම, සංගීතය බෙදා හැරීම (export), සංයෝජනය සහ සංගීත සංරචනය ය. (......)

**30.** සංගීත රිද්මයානුකූල බුද්ධිය පිළිබඳ අදහස් දැක්වූ දාර්ශනිකයෙක් වන්නේ,

(1) ඇල්බට් අයින්ස්ටයින් ය.
(2) ඇල්ෆ්‍රඩ් බිනේ ය.
(3) හෝවාර්ඩ් ගාඩ්නර් ය.
(4) කැතරින් සී. මෙඩිසි ය.
(5) යාකර් පේරි ය. (......)

● අංක **31** සිට **50** තෙක් ඇති ප්‍රශ්නවල ඇති හිස් තැන් සඳහා සුදුසුම පිළිතුරු යොදන්න.

**31.** තබ්ලාවෙන් වැයෙන ''ධා තිරිකිට ධිං ධිං'' යන ඝේකා කොටස උත්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන්නේ බායාවේ ''ගේ'' සහ .............. යන අක්ෂරත්, දහිනාවේ තා, ති, රි, ට සහ .............. යන අක්ෂරත් වේ.

**32.** උත්තර භාරතීය සංගීතයේ ගත් ශෛලියේ වාදිත සඳහා භාවිත පර්දා රහිත ස්වර පුවරුවකින් යුත් තිරස් අතට රඳවා වාදනය කෙරෙන, වාද්‍ය භාණ්ඩය ............................ වන අතර, එහි නාද උත්පාදනය සඳහා ............................ නමැති උපකරණය යොදා ගනු ලබයි.

**33.** නිර්දේශිත රාග අතුරෙන් ආරෝහණයේ දී පමණක් ස්වර දෙකක් වර්ජිත වන රාගය ............................ වන අතර, පංචමය සංවාදී ස්වරය වන ඖඩව ජාති රාගය වනුයේ .................................... රාගයයි.

**34.** උත්තර භාරතීය සංගීතයේ භාවිත ථාට දහය අතුරින් විකෘති ස්වර හතර බැගින් යෙදෙන ථාට වනුයේ ............................ සහ ................................ වේ.

● අංක **35** සිට **37** තෙක් ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ස්වර ඛණ්ඩය උපයෝගී කරගන්න.

ස නි ධ නි, <sup></sup>ස ම, ගු ම ධ, ම, ප ධ ම, ම ගු රි ස

**35.** ඉහත සඳහන් ස්වර ඛණ්ඩයෙහි සිව්වන සහ හයවන ස්වර සඳහා පිළිවෙළින් ................................ සහ ................................ යන ශිල්ප ක්‍රම භාවිත වේ.

**36.** ඉහත ස්වර ඛණ්ඩය සඳහා පාදක වී ඇති රාගය ................................ වන අතර, එහි විවාදී (ආගන්තුක) ස්වරය ................................ වේ.

**37.** දී ඇති ස්වර ඛණ්ඩයේ සියලු ම කෝමල ස්වර ශුද්ධ ස්වර බවට පත් කිරීමෙන් සහ සියලු ම ශුද්ධ ස්වර කෝමල ස්වර බවට පත් කිරීමෙන් බිහිවන රාගය වනුයේ ...................... ථාටයට අයත් ...................... රාගයයි.

**38.** ධමාර් තාලයේ මාත්‍රා සංඛ්‍යාවට සමාන මාත්‍රා සංඛ්‍යාවක් සහිත ...................... තාලයේ බලිස්ථානය පිහිටා ඇත්තේ ...................... වන මාත්‍රාව මත ය.

**39.** ගත් වාදනයකදී ''රිම පනි ධප මප ස්'' යන ස්වර පාදය සමග්‍රහයේ සිට තුන්වරක් වාදනය කර නැවත සමග්‍රහයට පැමිණේ නම් එම තාලය වනුයේ .................................................... ය. ඉහත ස්වර ඛණ්ඩයම යම් තාලයක තුන්වන මාත්‍රාවේ සිට තුන්වරක් වාදනය කිරීමෙන් සමග්‍රහයට පැමිණේ නම් එම තාලය වනුයේ ........................................ ය.

**40.** නෙළුම් ගී නාද රටා ආභාසයෙන් නිර්මාණය වූ 'දෑතට වලලු මල් මුතුවැල්' ගීතය ................................ ගායිකාව විසින් ගායනා කර ඇති අතර, 'රාජා ඕ මංගලියා' ගීතය පැරණි ජන ගී විශේෂයක් වූ ........................ නාද රටා ඇසුරෙන් නිර්මාණය වී ඇත.

**41.** 'අන්ද්‍ර ගුවන් හැර නැංග අසුන් පිට දෝ වැඩ ඉන්නේ' ගී පාදයේ සඳැස්මත් ගණන ............ කි. 'ගුණ දැනේ බෝසත් අනේ පෙර ඉපදුනේ ගිරවෙකු මෙනේ' ගී පාදය අයත් තිත ................................ වේ.

**42.** වාදනය ප්‍රමුඛ අපරදිග රංග ශෛලිය ...................................... නමින් හැඳින්වෙන අතර, වාදනය හා ගායනය යොදා ගැනෙන අපරදිග රංග ශෛලිය හැඳින්වෙනුයේ ...................................... නමිනි.

**43.** "ඨුමක චලිත රාම චන්ද්‍ර" භජන් ගීතය භාරතයේ විසූ මහා කවි ...................................................... විසින් ද 'පායෝජී මෛනේ රාම රතන ධන පායෝ" භජන් ගීතය ........................................ කිවිඳිය විසින් ද ප්‍රබන්ධ කර ඇත.

**44.** මිහිරි නාද කෝකිලාදි, රකිනු ඊශ්වරා සහ බන්දා මා දෙද්දො පියාණෝ යන ගීත ත්‍රිත්වය ඇතුළත් නූර්තියෙහි නම .................... වන අතර, එහි නිෂ්පාදකවරයා වන්නේ ................................................ සූරීන් ය.

**45.** වීරත්වය පෙන්නුම් කරන ...................................... ගී මහනුවර යුගයේ ප්‍රචලිත වී ඇති අතර කුවේණි අස්නේ කවි ...................................... ශෛලියෙන් ප්‍රබන්ධ වී ඇත.

**46.** ...................................... සූරීන් විසින් සංගීත අධ්‍යක්ෂණය කර ඇති මාතලන් චිත්‍රපටයේ ඇතුළත් ...................................... යන ගීතයෙහි පද නිර්මාණය වෙනත් ජාති ලක්ෂණයකටත්, තනු නිර්මාණය ඊට වෙනස් ජාති ලක්ෂණයකටත් නිර්මාණය වී ඇත.

**47.** ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා අධ්‍යක්ෂණය කළ රේඛාව චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය ............................ මහතාගේ වන අතර, එහි ගී තනු නිර්මාණය ................................ මහතාගේ වේ.

**48.** නූතන සරල සංගීතයේ ප්‍රස්තාර විධි අනුව [[ ]] සංකේතය ...................................... නමින් හැඳින්වෙන අතර, 𝄋. සංකේතය ...................................... නමින් හැඳින්වේ.

**49.** "මධුබනමෙ රාධිකා නාචීරේ" ගීතය ...................................... චිත්‍රපටයේ ඇතුළත් වන අතර, එය නිර්මාණයට පාදක වී ඇති රාගය ...................................... වේ.

**50.** ඉන්දියානු සහ පර්සියානු සංගීත සම්ප්‍රදායන්ගේ සංකලනයෙන් රාග නිර්මාණය කිරීමට පුරෝගාමී වූ සංගීතඥයෙකු වන ...................................... අයත් වනුයේ ...................................... යුගයට ය.

***

PAST PAPERS WIKI

WWW.PastPapers.WIKI

Download past papers, notes, and more from Past Papers Wiki!

08038

AL/2022(2023)/54/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)**
**General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)**

**පෙරදිග සංගීතය II**
**கீழைத்தேய சங்கீதம் II**
**Oriental Music II**

**54 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

✳ **I** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, **II** කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, **III** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් ලක්ෂණ කිහිපයකි.

A – ආරෝහණ සහ අවරෝහණ යන දෙකෙහිදී ම මධ්‍යමය සහ ධෛවතය වර්ජිත වේ.

B – ආරෝහණයේ දී පමණක් ගාන්ධාරය සහ නිෂාදය වර්ජිත වේ.

C – ආරෝහණයේ දී ගාන්ධාරය පමණක් වර්ජිත වේ.

(i) ඉහත සඳහන් ලක්ෂණ ඇතුළත් රාග **තුන** හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග රාගය සහ එහි ජාතිය පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 06 යි.)

(ii) A, B සහ C හි දැක්වෙන රාග අතුරින් සමප්‍රකෘති රාග යුගලය හඳුනාගෙන, එම රාගයන්හි ලක්ෂණ කරුණු **හයක්** ඔස්සේ සංසන්දනය කර දක්වන්න. (ලකුණු 06 යි.)

(iii) A, B සහ C හි දැක්වෙන රාග අතුරින් ඖඩව ජාති රාගයකට අයත් මධ්‍යලය ගීතයක් හෝ වාදිතයක් ස්ථායි, අන්තරා වශයෙන් තාල සංඥා සහිතව ස්වර ප්‍රස්තාර කර, එයට අදාළ මාත්‍රා 16 කට නො අඩු තානාලංකාර **දෙකක්** ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 08 යි.)

**2.** පහත A සිට G දක්වා සඳහන් වනුයේ **විවිධ රාගයන්ට** අයත් රාග ලක්ෂණයන් ය.

| | | | |
|---|---|---|---|
| A | ථාටය | – | කාෆි |
| B | විවාදී ස්වරය | – | <u>ග</u>ං |
| C | වාදී ස්වරය | – | රි |
| D | වක්‍රව යෙදෙන ස්වරය | – | ප |
| E | සංවාදී ස්වරය | – | ස |
| F | ගානසමය | – | රාත්‍රී දෙවන ප්‍රහරය |
| G | වර්ජිත ස්වර | – | රි, ප |

(i) ඉහත දී ඇති රාග ලක්ෂණ තුන බැගින් අඩංගු වන රාග **දෙකක්** හඳුනාගෙන, අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත (i) හි හඳුනාගත් රාග අතුරෙන් **එක්** රාගයක් තෝරාගෙන, ඊට අදාළ මධ්‍යලය ඛ්‍යාල් ගීතයක් හෝ වාදිතයක් ස්ථායි සහ අන්තරා වශයෙන් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) ඉහත (i) හි හඳුනාගත් රාග දෙක අතුරෙන් එක් රාගයකට අදාළ සර්ගම් ගීතයක් හෝ තරාණා ගීතයක් ස්ථායි සහ අන්තරා වශයෙන් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iv) ඉහත (i) හි තෝරා **නොගත්** සහ A සිට G දක්වා ඇති රාග ලක්ෂණ අතුරෙන් **එකක්** හෝ අඩංගු රාගයකට අයත් සර්ගම් ගීතයක් ස්ථායි සහ අන්තරා වශයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

**3.** (1) ම ප, ස̇ නි̲ ධ̲ ප, ධ̲ ස̇

(2) ම ප නි ස̇ නි̲ ධ ප, ම ග රි

(3) ම ප ධ̲ ධ̲, නි ස̇, නි ධ̲ ප, ම

(4) ම ප ස̇ ප ධ ම ග

(5) ප නි ස̇ නි ප, ග ප රි

(6) ම ධ නි̲ ස̇, නි̲ ධ ම ප ධ, ම ග̲ රි ස

(i) ඉහත ස්වර ඛණ්ඩ අයත් වන රාග හඳුනාගෙන, අදාළ අංකය සමග රාගය නම් කරන්න. (ලකුණු 06 යි.)

(ii) ඉහත හඳුනාගත් රාග අතුරෙන් භෛරව ථාටයට අයත් රාගයට අදාළ මධ්‍යලය ඛ්‍යාල් ගීතයක් හෝ වාදිතයක් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) ඉහත හඳුනාගත් රාග අතුරෙන් ඔබ කැමති රාගයකට අයත් විලම්බලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

## II කොටස

**4.** පහත දැක්වෙන්නේ නිර්දේශිත ජන ගීවලට අයත් ගී පාද කිහිපයකි.

(a) බැද්ද වටට සුදු මොරමල් පිපිලා – කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා

(b) දේවතා දුවක් ඇවිදින් කියන්නේ – වරම් වරම් ශක්‍ර මහ බඹු දෙවිගෙ වරම්

(c) ලක්ෂ්මී බුජවාසා – සුරිඳුන් පෙර සිටන් බල යුත් සැවති දූන්

(i) (a), (b) සහ (c) යන ගී පාද යුගලයන්හි දැක්වෙන ගී වර්ග හඳුනාගෙන වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 06 යි.)

(ii) ඉහත දක්වා ඇති ගී වර්ග අතුරෙන් සේ ගී ගණයට අයත් වන ගී යුගලය සංසන්දනය කර දක්වන්න (පිළිතුරට කරුණු හයක් ප්‍රමාණවත් ය). (ලකුණු 06 යි.)

(iii) ඉහත ගී අතුරෙන් 'පරිසර වර්ණනා' ඇතුළත් ගීතයක් තෝරාගෙන එම අවස්ථා උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) (b) හි දැක්වෙන ගී පාද දෙකින් ඔබ කැමති ජන ගීයක මුල් පාදය පමණක් ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04 යි.)

**5.** (i) සොකරි හා කෝලම් රංග ශෛලිය පිළිබඳ ව පහත සඳහන් කරුණු ඔස්සේ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

- රංග ලක්ෂණ
- ගී පද සහ ගී තනුවල ස්වභාවය
- වාද්‍ය භාණ්ඩ

(ලකුණු 06 යි.)

(ii) නාඩගම් ගී හා සම්බන්ධ පහත සඳහන් අංග අතුරෙන් **තුනක්** පිළිබඳ ව උදාහරණ සහිතව විස්තර කරන්න.

- තෝඩායම
- ඉන්නිසය
- උරුට්ටුව
- තර්ගය

(ලකුණු 06 යි.)

(iii) (a) නූර්ති සංගීතයේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(b) නිර්දේශිත නූර්ති ගීයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

## III කොටස


**6.**




(i) මූලික ශ්‍රැති ස්වරය (tonic note) අපරදිග 'C' ස්වරයට සමාන සේ සලකා, ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(ii) ඉහත ප්‍රස්තාරයේ දැක්වෙන ප්‍රකාශන සංකේත නම් කර, ඒවා විස්තර කරන්න. (ලකුණු 08 යි.)

(iii) පහත ප්‍රස්තාරයට ගැළපෙන මූලික කෝඩ්ස් (principal chords) ප්‍රස්තාර කර දක්වන්න.



(ලකුණු 04 යි.)

**7.** (i) මුල් යුගයේ සිංහල චිත්‍රපට සංගීතයට දායක වූ සංගීත අධ්‍යක්ෂවරුන් **සිව් දෙනෙකු** නම් කර, ඉන් **දෙදෙනෙකුගේ** නිර්මාණ කාර්යයන් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

(ii) සරල ගී හා චිත්‍රපට ගී අතර සමාන හා අසමාන ලක්ෂණ ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

(iii) ප්‍රේමසිරි කේමදාස, සරත් දසනායක, සෝමදාස ඇල්විටිගල, ඩබ්ලිව්.ඩී. අමරදේව යන සංගීත අධ්‍යක්ෂවරුන් අතුරෙන් **තිදෙනෙකුගෙන්** චිත්‍රපට සහ සරල සංගීතය සඳහා ලැබුණු දායකත්වය කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

**8.** (i) විභාග තුළ මාත්‍රා සංඛ්‍යාවන් අසමාන ලෙස යෙදෙන, ධා, තා, ධිං, තිං යන අක්ෂර පමණක් භාවිත නිර්දේශිත තාලය නම් කරන්න. එම තාලය, තාල සංඥා සහිතව සමගුණ සහ දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(ii) පහත සඳහන් පද අර්ථවත් වන සේ ගළපා, ඉහත (i) හි නම් කළ තාලයට අනුව ගීත ආවර්ත **දෙකක්** නිර්මාණය කරන්න.

| | | | |
|---|---|---|---|
| බැසයන | අතරේ | සුපිපුණු | හදෙහි |
| මතුවේ | තඹුරු | දියරළි | උදේ |
| ගලා | සොඳුරු | විලසේ | සරුකරවයි |
| ගලා | ගලා | ගංගා | හසරැල් |

(ලකුණු 06 යි.)

(iii) ඉහත (ii) හි නිර්මාණය කළ ගීත ආවර්ත දෙකට ගැළපෙන තනුවක් දේස් රාගය ඇසුරෙන් නිර්මාණය කර, ගීත ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 08 යි.)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI
Download past papers, notes, and more from Past Papers Wiki!